# කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර

## පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය -2023/2024

## INR 1101 - ජාත්‍යන්තර සබඳතා පිළිබඳ හැඳින්වීම

පැය <u>දෙකයි (02)</u>

ඕනෑම ප්‍රශ්න <u>**තුනකට (03)**</u> පිළිතුරු සපයන්න.

---

1. කොටස් <u>**දෙකටම**</u> පිළිතුරු දෙන්න.
   - I. ජාත්‍යන්තර සබඳතා ශාස්ත්‍රීය විෂයක් ලෙස නිර්වචනය කරන්න. (ලකුණු 10)
   - II. ජාත්‍යන්තර සබඳතාවල වර්ධනයේ අවධීන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

2. පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරමින් 'ජාත්‍යන්තර සබඳතාහි පාත්‍රයන් ' පිළිබඳ රචනයක් ලියන්න.
   - I. පාත්‍රයන් සඳහා නිර්වචන
   - II. පාත්‍රයෙකු ලෙස රාජ්‍යයේ භූමිකාව
   - III. විවිධ වර්ගයේ රාජ්‍ය නොවන පාත්‍රයන් (ලකුණු 20)

3. දාර්ශනික පදනම් සහ ප්‍රධාන අභ්‍යුපගමන සැලකිල්ලට ගෙන, ජාත්‍යන්තර සබඳතාහි සම්භාව්‍ය ප්‍රවේශයන් ලෙස විඥානවාදය සහ යතාර්ථවාදය අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 20)

4. කොටස් <u>**දෙකටම**</u> පිළිතුරු සපයන්න.
   - I. ජාත්‍යන්තර සබඳතා තුළ බලය යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 08)
   - II. නූතන ජාත්‍යන්තර පද්ධතියේ බල ගතිකයන් මැනීමට ක්ලයින් සූත්‍රය (Cline formula) තවමත් අදාළ වේ යැයි ඔබ සිතනවාද? උදාහරණ සමඟ ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 12)

5. කොටස් <u>**දෙකටම**</u> පිළිතුරු සපයන්න.
   - I. ආරක්ෂාව පිළිබඳ සංකල්පය සඳහා පවතින විද්වත් නිර්වචන <u>**දෙකක්**</u> කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)
   - II. සාම්ප්‍රදායික ආරක්ෂාව (Traditional Security) සහ සාම්ප්‍රදායික නොවන ආරක්ෂාව (Non-Traditional Security) අදාළ උදාහරණ සමඟ සංසන්දනය කරන්න. (ලකුණු 12)

6. අදාළ නිර්වචන උපුටා දක්වමින්, පහත මාතෘකාවලින් <u>**දෙකක්**</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   - I. අරාජිකත්වය පිළිබඳ සංකල්පය (The concept of Anarchy)
   - II. ජාත්‍යන්තර පද්ධතිය (International System)
   - III. යුද්ධය පිළිබඳ සංකල්පය (The concept of War)
   - IV. ජාතික අභිලාෂය පිළිබඳ සංකල්පය (The concept of National Interest) (ලකුණු 10 × 02)

***************